**Fuel Pass FAQ – (Sinhala)**

1. **මගේ වාහනයත් මගේ දුරකථන අංකයත් වෙනස් වී නැත්නම්, මට දැනට තිබෙන QR code එක භාවිතා කරගෙන යා හැකිද?**
   ඔව්. දැනට තිබෙන QR code වලංගුයි. ඔබ ලියාපදිංචි කර ඇති දුරකථන අංකය භාවිතා කර වෙබ් අඩවියට Login වීමෙන් ඔබගේ QR code එක ලබාගත හැක.

2. **පෙර හිමිකරු විසින් QR code එකක් ලියාපදිංචි කර ඇති වාහනයක් මම මිලදී ගත්තා. නව හිමිකරුවා ලෙස මට QR code එක ලබාගන්නේ කෙසේද?**
   ඔබ වාහනය වෙබ් අඩවියේ නැවත Register කළ යුතුයි. එවිට නව QR code එකක් ලබාගත හැක.
   මෙය **2026 මාර්තු 17 සිට** ලබාගත හැක.

3. **මගේ වාහනය වෙනත් පුද්ගලයෙකුට හිමිකම් මාරු කර තිබේ නම් මම කුමක් කළ යුතුද?**
   ඔබගේ ලියාපදිංචි දුරකථන අංකය භාවිතා කර (OTP මඟින් තහවුරු කර) Login වී **"Delete Profile"** විකල්පය තෝරා ඔබගේ පැරණි වාහනයේ QR code එක ඉවත් කරන්න.
   එවිට නව හිමිකරුට වෙබ් අඩවියෙන් නැවත Register කර නව QR code එකක් ලබාගත හැක.

පසුව ඔබට එම දුරකථන අංකය භාවිතා කර නව වාහනයක් Register කර QR code එකක් ලබාගත හැක.
මෙය **2026 මාර්තු 17 සිට** ලබාගත හැක.

4. **මගේ දුරකථන අංකය දිගු කාලයක් භාවිතා නොකළ නිසා Recycled නම් කුමක් කළ යුතුද?**
   ඔබ වාහනය වෙබ් අඩවියේ නැවත Register කළ යුතුයි. එවිට නව QR code

එකක් ලබාගත හැක.
මෙය **2026 මාර්තු 17 සිට** ලබාගත හැක.

5. **මම අලුතින් මිලදී ගත් නව වාහනයක් සඳහා QR code එක ලබාගන්නේ කෙසේද?**
   සියලුම නව වාහන Fuel Pass වෙබ් අඩවිය මඟින් Register කළ යුතුය.
   යම් දෝෂයක් පෙන්වන්නේ නම් **2026 මාර්තු 17** දින නැවත Register කිරීමට උත්සාහ කරන්න.

6. **Register කරන විට "Chassis number is incorrect" යන දෝෂය පෙන්වන්නේ නම් කුමක් කළ යුතුද?**
   වාහනයේ හිමිකරු **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව (DMT)** හරහා එම තොරතුරු නිවැරදි කරවා ගත යුතුය.

7. **Register කරන විට "Vehicle Already Registered" යන දෝෂය පෙන්වන්නේ නම් කුමක් කළ යුතුද?**
   කරුණාකර **2026 මාර්තු 17** දින නැවත උත්සාහ කරන්න.

8. **50cc ට අඩු වාහන සඳහා QR Code Register කරන්නේ කෙසේද?**
   QR Fuel Pass ලබාගත හැක්කේ **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව (DMT)** යටතේ ලියාපදිංචි වාහන සඳහා පමණි.

**10. Fuel Pass වෙබ් අඩවිය ක්‍රියා නොකරයි. මම කුමක් කළ යුතුද?**
Fuel Pass වෙබ් අඩවිය දැනට ක්‍රියාත්මකයි. තාවකාලික තාක්ෂණික ගැටලුවක් තිබේ නම්, කරුණාකර මිනිත්තු කිහිපයක් රැඳී සිට නැවත වෙබ් අඩවියට පිවිසීමට උත්සාහ කරන්න.

**11. OTP කේතය මට මිනිත්තු 2 ක කාල සීමාව ඉකුත් වූ පසු ලැබෙනවා. මම කුමක් කළ යුතුද?**
OTP කේතය කල් ඉකුත් වූ පසු ලැබේ නම්, **Resend** බොත්තම ක්ලික් කර නව OTP කේතයක් ඉල්ලන්න.

**12. එකම NIC එක යටතේ වාහන කිහිපයක් Register කළ නොහැක. මම කුමක් කළ යුතුද?**
දැනට Fuel Pass පද්ධතියේ **එක් NIC එකකට සහ එක් දුරකථන අංකයකට එක් වාහනයක් පමණක්** Register කළ හැක.
වෙනත් වාහනයක් Register කිරීමට, වෙනත් **NIC එකක් සහ වෙනත් දුරකථන අංකයක්** භාවිතා කළ යුතුය.

**13. ජෙනරේටර් වැනි වාහන නොවන භාවිත සඳහා Fuel QR code එකක් Register කළ හැකිද?**
දැනට Fuel Pass පද්ධතිය වාහන Register කිරීම සඳහා පමණක් භාවිතා කරයි.
වාහන නොවන භාවිත සඳහා ඉන්ධන ලබාදීම පිළිබඳව ශ්‍රී ලංකා රජයේ අනාගත තීරණ අනුව පහසුකම් හදුන්වා දෙනු ඇත.

**14. Fuel Pass පද්ධතිය භාවිතා කිරීමට Smartphone එකක් අවශ්‍යද?**
Smartphone එකක් අවශ්‍ය නොවේ. Smartphone හෝ Computer එකක් ඇති පුද්ගලයෙකුගේ උදව්වෙන් Register කිරීම කළ හැක.
Register කිරීමෙන් පසු QR code එක **මුද්‍රණය (print)** කර භාවිතා කළ හැක.

**15. Fuel Pass වෙබ් අඩවිය බහු භාෂා සඳහා සහය දක්වයිද?**
ඔව්. Fuel Pass වෙබ් අඩවිය **සිංහල, தமிழ் සහ English** භාෂා සඳහා සහය දක්වයි.

**16. මගේ වාහනයේ Chassis number එක සොයාගන්නේ කොහෙන්ද?**
Chassis number එක ඔබගේ

- **වාහනයේ**
- **වාහන ලියාපදිංචි සහතිකයේ (CR Book)**
- **වාහන රක්ෂණ ලේඛනයේ**
  සොයාගත හැක.

**17. ගැටලු ඇති වුවහොත් සහාය ලබාගැනීමට දුරකථන අංකයක් තිබේද?**
දැනට Fuel Pass පද්ධතිය සම්බන්ධයෙන් සහාය සඳහා **1919** අංකයට අමතන්න.
අනාගතයේදී තවත් සහාය මාර්ග හඳුන්වා දෙනු ඇත.

**18. සංචාරක සහ වාණිජ වාහන සඳහා වැඩි ඉන්ධන අවශ්‍ය වේ. ඒ සඳහා වෙනම quota එකක් ලබාදෙනවාද?**
සංචාරක හා වාණිජ ප්‍රවාහන වැනි වැඩි ඉන්ධන අවශ්‍ය කර්මාන්තවල අවශ්‍යතා රජය විසින් සමාලෝචනය කරනු ඇත.
ඒ අනුව සුදුසු සහාය හෝ වෙනස්කම් හඳුන්වා දිය හැක.